# බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය තනතුර සඳහා අදාළ පළමු වන, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2019

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය තනතුර සඳහා අදාළ වන පළමුවන, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2019 වර්ෂය සඳහා පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**02. සුදුසුකම්**

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය තනතුරේ III ශ්‍රේණියේ පත්වීම් ලබා මෙතෙක් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය තනතුරේ II ශ්‍රේණියට පත් වී මෙතෙක් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය තනතුරේ I ශ්‍රේණියට පත් වී මෙතෙක් තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2020.01.17 වේ.

**03. අයදුම්පත්**

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත් අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් 2020.01.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. ඒ සමග අදාළ ශ්‍රේණියට පත්කළ/ අන්තර්ග්‍රහණය කල ලිපියේ පිටපතක් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 08 දක්වාත් දෙවන පිටුවේ අංක 09 සිට 10 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**04. විභාගයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාධිපති වෙත ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය